## ලංසු නිවේදනය

යොමුව-නාරා/පාලන/2025/65/RL/ටෙන්ඩර් අංක32

ධීවර,ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය

ජාතික ජලජ සම්පත් පර්යේෂන හා සංවර්ධන නියෝජිතායතනය,කාක දූපත,මට්ටක්කුලිය,කොළඹ-15

# නාරා-කළුතර ප්‍රවාහන සේවා ලබා ගැනීම සඳහා ලංසු කැඳවීම - 2026.

ජාතික ජලජ සම්පත් පර්යේෂන හා සංවර්ධන නියෝජිතායතනයේ (නාරා)කාර්ය මණ්ඩලය ප්‍රවාහනය කිරිම සඳහා ප්‍රසම්පාදන මණ්ඩලය විසින් මාසිකව ගෙවීමේ පදනම මත නාරා-කළුතර ප්‍රවාහන සේවාව සඳහා කුළී වාහන ලබා ගැනීම වෙනුවෙන් ලංසු ඉදිරිපත් කරන ලෙසට මෙයින් ආරාධනා කරමි.

01. අදාළ වන්නාවූ විස්තර සහිත ලංසු ආකෘති හා ලංසු ආරාධනා ලේඛණය ලබා ගත හැක්කේ ආපසු නොගෙවන රු:1,000.00 ක මුදලක් අධ්‍යක්ෂක ජනරාල්/නාරා නමින්,නාරා සරප් වෙත ගෙවීමෙන් පසුව මිලදී ගැනුම් හා සැපයුම් ඒකකය වෙතිනි. සේවා කොන්ත්‍රාත් කාලය එක් වසරක් වේ.

| ප්‍රවාහන සේවාව | ගමන් මාර්ගය | එක් ගමන් මාර්ගයක දුර කි.මී | ආරම්භ කළ යුතු වේලාව හා ස්ථානය | ආපසු ගමන් කළ යුතු වේලාව හා ස්ථානය | අවශ්‍ය ආසන සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| නාරා<br>-<br>කළුතර | කළුතර බස් නැවතුම ඉදිරිපිට සිට ගාලු පාර ඔස්සේ කොටුව දුම්රියපොළ ඉදිරිපිට මල්වත්ත පාරේ සිට අබ්දුල් කාදර් මාවත (රෙක්ලමේෂන් පාර)අලුත් මාවත පාර,විස්ට්වයික් පාර,සී බීච් පාර,නාරා පාර ඔස්සේ මට්ටක්කුලිය කාක දූපත නාරා ප්‍රධාන කාර්යාලය හා ආපසු ධාවනයේදී<br><br>නාරා ප්‍රධාන කාර්යාලයේ සිට නාරා පාර,සී බීච් පාර,විස්ට්වයික් පාර,අලුත්මාවත පාර,කේ සිරිල් සී පෙරේරා මාවත,බ්ලුමැන්ඩල් පාර,ආමර් වීදිය,පංචිකාවත්ත,මරදාන දුම්රිය පොළ, ටෙක්නිකල් හන්දිය,පිටකොටුව හරහා ගාලු පාර ඔස්සේ කළුතර බස් නැවතුම දක්වා. | කි.මී<br>50.0 | පෙ.ව 06.20 ට කළුතර බස් නැවතුම ඉදිරිපිට සිට (මාර්ග තදබදය මත වේලාව සංශෝධනයට යටත් වේ)<br><br>කොටුව මල්වත්ත පාරට උදෑසන 08.05 වන විට පැමිණිය යුතුවේ.<br>එම ස්ථානයෙන් පෙ.ව8.10 ට නාරා දක්වා ගමන් ආරම්භ කල යුතුය. | ප.ව 04.20 ට කොළඹ-15 මට්ටකුලිය නාරා ප්‍රධාන කාර්යාලයෙන් | 26<br>-<br>30<br>අතර |

02. ලංසුවේ වලංගු කාලය ලංසු භාර ගන්නා අවසාන දිනයේ සිට දින 90 ක් එනම් , 2026.02.25 තෙක් විය යුතුය.

03. ලංසුව ඉදිරිපත් කිරිමේදී පිළිගත් වාණිජ බැංකුවකින් ලබා ගත් රු:15,000.00 ක ලංසු සුරක්ෂණයක් හෝ අධ්‍යක්ෂක ජනරාල්/නාරා නමින් නාරා සරප් වෙත මුදල් ගෙවා එහි මුල් පිටපත ලංසුව සමග ඉදිරිපත් කළ යුතුය.ලංසු සුරක්ෂණයේ වලංගු කාලය දින 119 ක් ,එනම් 2026.03.26 දක්වා වේ.

04. ලංසුව ඉදිරිපත් කිරිමේදී ආකෘතියේ කපා හෝ මකා හෝ වෙනයම් ආකාරයකින් හෝ වෙනසක් සිදු කරන්නේ නම් එම ස්ථානයන් හි ස්වකීය කෙටි අත්සන හා මුද්‍රාව යොදා එම වෙනස් කිරිම සහතික කළ යුතු අතර,එසේ නොවන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. ලංසු ලේඛණ නිකුත් කරනු ලබන්නේ 2025.11.18 සිට 2025.11.27 වන දින දක්වා පමණි.මේ සම්බන්ධ පූර්ව ප්‍රසම්පාදන රැස්වීම 2025.11.25 දින පෙ.ව 10.00 ට නාරා ප්‍රධාන ශ්‍රවණාගාරයේදී පැවැත්වේ.

06. මුද්‍රා තබන ලද ඔබගේ ලංසුව 2025.11.28 වන දින ප.ව 01.00 ට පෙර ''සභාපති,ප්‍රසම්පාදන කමිටුව, ජාතික ජලජ සම්පත් පර්යේෂන සහ සංවර්ධන නියෝජිතායතනය,කාක දූපත,මට්ටක්කුලිය,කොළඹ-15 යන ලිපිනයට ,ලියාපදිංචි තැපෑලෙන් හෝ ප්‍රධාන ගොඩනැගිල්ලේ පළමු මහලේ පිහිටා ඇති මුදල් අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටි අංක-01 ට බහාලිමෙන් හෝ ඉදිරිපත් කළ හැකිය.

ලංසු බහාලන කවරය මුද්‍රා තබා ඉදිරිපත් කළ යුතු අතර,එම කවරයේ වම්පස ඉහළ කෙළවර "නාරා -කළුතර කාර්ය මණ්ඩළ ප්‍රවාහන සේවා සදහා මිළ ගණන් කැදවීම-2026/ටෙන්ඩර් පෙට්ටි අංක- 01" යනුවෙන් සදහන් කළ යුතුය.

07. 2025.11.28 දින ප.ව 01.00 ට ඉදිරිපත් වී ඇති ලංසු එදින එම වේලාවට ජාතික ජලජ සම්පත් පර්යේෂන හා සංවර්ධන නියෝජිතායතනනයේ (නාරා) මුදල් අංශයේදී විවෘත කරනු ලබන අතර ,එම අවස්ථාවට ලංසුකරුට හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයකුට සහභාගි විය හැකිය.

08. මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු ,(අවශ්‍ය කෙරෙන වාහන වල විස්තර ,ගමන් මාර්ග හා අනෙකුත් පිරිවිතරයන්) **www.nara.ac.lk** නාරා වෙබ් අඩවිය මගින් හා 0112-521000/0112-529717,මිලදී ගැනුම් හා සැපයුම් නිළධාරි/නාරා මගින් ලබා ගත හැකිය.

ප්‍රසම්පාදන කමිටු තීරණය අවසන් තීරණය වේ.

සභාපති
ප්‍රසම්පාදක මණ්ඩලය
ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය
කාක දූපත ,මට්ටක්කුලිය
කොළඹ-15
0112-529717/0112-521000

දිනය-2025.11.18